# MANRECAP මාසික පුවත් නිවේදනය #17

| අප්‍රියෙල් 2007 | #17 |
|---|---|

## 1. පසුගිය වසරේ ක්‍රියාකාරීත්වයන් ගැන විමසුම සහ 2007/08/ මූල්‍ය වර්ෂයට පිය නැගීම.

පසුගිය වසර තුනේම වැඩ කටයුතු සාර්ථකව නිම කිරීමෙන් මැන්රිකැප් ව්‍යාපෘතිය ව්‍යාපෘති ක්‍රියාවලියේ 4 වන සහ අවසාන අවුරුද්ද වෙත පිය නගමින් සිටී. දැන් අපි ව්‍යාපෘති නිම කිරීමේ කාර්යයට ළඟාවෙමින් සිටී.

මැන්රිකැප් ඉලක්ක ගම්මාන දහයේ ප්‍රජාපාලක පුනරුත්තාපන කටයුතු සහ සමාජීය ආර්ථික කටයුතු ජනතාව අතර තදින් මුල් බැසගෙන ඇත. විශේෂයෙන්ම කාන්තා ඉතිරිකිරීම් කටයුතු කෘෂි සේවා කටයුතු මේ අතර වේ.

මේ ව්‍යාපෘතියට ඇතුලත් ප්‍රදේශවල ආරක්ෂක තත්වය ඉතාම නරක අතට පත් වූ අවස්ථාවලදීත් විශේෂයෙන්ම පලිආරු ඇලමාර්ගය පුනරුත්තාපන කටයුතු නැවැත්වීමට සිදුවූවත් ඔවුන්ගේ ආර්ථික ක්‍රියාවලියන් දිගටම පවත්වා ගෙන යැමට සමත් විය. ඔවුන්ගේ ම ප්‍රයෝජනය සහ යහපත දියුණුව සඳහා මේ ක්‍රියාවලියන් ඉතාම අවශ්‍ය බව ඔවුනට මැනවින් අවබෝධ වී ඇත.





මේ මූල්‍ය වසර තුලදී මේ ව්‍යාපෘතියේ ප්‍රජා පාලන පුනරුත්තාපන වැඩ 18 ක් පවත්වා ගෙන ගොස් සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වේ. මේ පුනරුත්තාපනය වූ පහසුකම් රජයේ සහයෝගය ඇතිව මේ ප්‍රදේශයේ ජනතාවට මේවා පවත්වා ගෙන යැමට ක්‍රියාත්මක කිරීමට හැකිවේ යැයි බලාපොරොත්තු වෙයි. අපි ප්‍රදේශයේ ජනතාවත් සමග ආර්ථික හා සමාජීය ක්‍රියාකාරකම් සඳහා තිරසාර පද්ධති හඳුන්වාදී ව්‍යාපෘති කාලය අවසන් වීමට කලින් මේ සියල්ලම අවසන් කිරීමට කටයුතු යොදා ඇත.

ඉලක්ක ගම්මාන වල ජන ජීවිතයට අවශ්‍ය කටයුතු සම්පාදනය කරමින් ජන ජීවිතය නගා සිටවීමට ක්‍රියාකරමින් සිටී. අපි ව්‍යාපෘතියේ අවසන් වසර ඉතාමත් ම සාර්ථක ව අවසන් කිරීමට කටයුතු සම්පාදනය කර ඇත.

## 2. සාරි පින්තාරු කිරීමේ පුහුණුව

මේ ප්‍රදේශයේ වනිතාවන් සඳහා ඉතාම සාර්ථක ගෘහ කර්මාන්තයක් නම් සාරි පින්තාරු කිරීමය. මේ මුද්‍රිත සාරි සඳහා විශේෂ ඉල්ලුමක් ද පවතී. විශේෂයෙන්ම මංගල සාරි සඳහා හොඳ ඉල්ලුමක් ද එමෙන්ම හොඳ මිලක් ද ලබාගත හැකිය. මේ ඉලක්ක ගම්මාන වල සිටින කාන්තාවන්ගේ ඉල්ලුම අනුව මේ සාරි පින්තාරු කිරීමේ වැඩ සටහන ආරම්භ විය. ඒ වැඩ සටහන ගම්මාන හතරක ආරම්භ විය. ඒවා නම් පුත්තුකමාම් ග්‍රාම නිලධාරී කොට්ඨාශයක් තුල ඇති පුත්තුකමාම්, වඩ්ඩුපිත්තමාඩු, තෙන්නවාඩි මාරුදන්කුලම් සහ සමය පුරම් යන ගම්මාන වලය මේ පුහුණු වැඩ සටහනේ පලමුවන මාසය මාර්තු



මාසයේදී අවසන් විය. දැන් එහි කාන්තාවන් 20 දෙනෙකු දිගටම පුහුණු වීම කරගෙන යයි.

මෙයට අමතරව මෙහි පලමු වරට වඩ්ඩුපිත්තමාඩු ගමේ කාන්තා ග්‍රාම සංවධන සමිති සමග එක්ව කටයුතු කිරීමට ලැබුණු පලමු අවස්ථාවයි. මේ පුහුණු වැඩ සටහන තුලින් කාන්තා ග්‍රාම සංවර්ධන සමිති වල හැකියා වර්ධනය කිරීමටත් එමෙන්ම ඒ ප්‍රදේශයට අවශ්‍ය සමාජීය හා ආර්ථික ක්‍රියාවලියක් පවත්වා ගෙන යැමටත් අදහස් කරයි.

### 3. මාන්තායි බටහිර උප දිසාපති කොට්ඨාශය තුල පැල තවාන් ආශ්‍රිතව කොම්පොස් පොහොර නිෂ්පාදනය කිරීම.

බටහිර මාන්තායි උපදිසාපති කොට්ඨාශය තුල පිහිටි සේවා ගම, ගනේෂපුරම්, සිතුවිනයාගකුලම් යන ගම් වල පැල තවන් වල කොම්පෝස් පොහොර නිෂ්පාදනය පිණස ප්‍රදේශයේ සොයා ගත හැකි අමුද්‍රව්‍ය වන ගොම, පිදුරු සහ දහයියා පාවිච්චිට ගෙන ඇත.

සේවා ගම සහ ගනේෂපුරම් යන ගම්වල ඇති පැල තවාන් කොම්පෝස් පොහොර නිපදවන අතර මේ පොහොර නිෂ්පාදනය කෙරෙන ආකාරය ගැන ගමේ ජනතාවට ද පුහුණුවක් ලබා දී ඇති නිසා ඔවුන් ද පොහොර නිෂ්පාදනයට සහභාගී වේ. සමහර ගොවින් දැනටමත් කොම්පෝස් නිපදවමින් ඒවා තමන්ගේ ගෙවතු වගාවන් සඳහා ප්‍රයෝජනයට ගෙන ඇත. දැනට සති හයක කාල සීමාවක් තුල දී තමන්ට කොම්පෝස් නිපදවා ගත හැක. මේ කාරණාව හේතු කරගෙන ගොවීන්ට රසායනික පොහොර භාවිතා නොකොට කොම්පෝස් භාවිතයෙන් ලොකු මුදලක් ඉතිරිකර ගැනීමට ද හැකි වී ඇත.



